## ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව- කොළඹ, ශ්‍රී ලංකාව

### ඉතා වැදගත් විශේෂාංග ලේඛනය

**බැංකුව විසින් සපයන ගිණුම් පාලනය වන, මා/අප විසින් දැනටමත් පිළිගෙන එකඟ වී ඇති ගිණුම් විවෘත කිරීමට අදාළවන නීතිරීති හා කොන්දේසිවලට අමතරව, ගිණුම සම්බන්ධයෙන් පහත දැක්වෙන නීතිරීති හා කොන්දේසිවලින් බැඳී සිටීමට මම/අපි තවදුරටත් එකඟ වී පිළිගෙන සිටිමි/මු.**

(ගිණුම් අංකය)--------------------- (මුදල් වර්ගය)-------------------------

- **සුපර් වැලියු ඉතුරුම් ගිණුම්/ සුපර් වැලියු ජංගම ගිණුම/ මයි ඩ්‍රීම් ගිණුම සේවක බැංකුකරණය** යන ගිණුම්වල විශේෂාංග මා/අප තෘප්තිමත් වන පරිදි බැංකුවේ නියෝජිතයා විසින් මා/අප හට පැහැදිලි කර දෙන ලදී.

- බැංකුව විසින් ගිණුම සඳහා සපයන අයදුම්පත, බැංකුව විසින් නිර්දේශ කර ඇති අදාළ සියලු ලේඛන මා/අප විසින් සැපයීමෙන් පසුව සහ එම ලේඛන බැංකුවේ සියලු අවශ්‍යතා සම්පූර්ණ කළ විට, ක්‍රියාවේ යෙදවෙනු ඇත.
- මෙම නිතිරීති සහ කොන්දේසිවලින් කිසිවක් ඉවත්කරගැනීමට/වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමට අයිතිය බැංකුව රඳවා ගන්නා අතර, යම් නීතිරීතියක් හෝ කොන්දේසියක් අතර අනනුකූලතාවක් මතුවන විට එය බැංකුව විසින් විසඳනු ඇති අතර, එහි තීරණය අවසානාත්මක හා බන්ධනීය වනු ඇත.
- බැංකුව විසින් නිශ්චය කරන කාලයන් හි දී හවුල්කාර ආයතනවල නව අර්පණයන් සහ ප්‍රතිලාභ කිසිවක් ඉවත්කරගැනීමට, වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ හඳුන්වාදීමට අයිතිය බැංකුව රඳවා ගනියි.
- ගිණුම ආරම්භ කරන අවස්ථාවේ දී සපයා ඇති උපදෙස්වලට අනුව ගිණුම් ප්‍රකාශනය මා හට/අපට එවනු ඇති බවට මම/අපි එකඟ වෙමි/මු.
- ඉහත කරුණුවලට අමතරව, පහත දැක්වෙන ගිණුම් ආකාරවලට විශේෂිත නීතිරීති සහ කොන්දේසිවලට ද මම/අපි එකඟ වෙමි/මු.

| **සුපර් වැලියු ඉතුරුම් ගිණුම** |
|---|
| • ගිණුම ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘත කර පවත්වාගෙන යනු ඇත.<br>• **සුපර් වැලියු ඉතුරුම් ගිණුමක්** විවෘත කිරීම සඳහා **ශ්‍රීලංරු.25,000**ක මූලික තැන්පතුවක් අවශ්‍ය වන අතර, සාමාන්‍ය ශේෂය ශ්‍රී ලංකා රු.10,000ට වඩා පහත වැටුණහොත් කිසිදු පොලියක් |

නොගෙවනු ඇත. සාමාන්‍ය මාසික ශේෂය **ශ්‍රීලංරු.25,000**ට වඩා පහත වැටුණහොත් **ශ්‍රීලංරු.650**ක ගාස්තුවක් අයකෙරෙන ඇති බවට ද මම/අපි එකඟ වෙමි/මු.

- දිනපතා ශේෂය මත පොලිය ගණනය කෙරෙන බවට ද එය මාසිකව බැර කෙරෙන බවට ද මම/අපි අවබෝධ කරගෙන සිටිමි/මු.

**සුපර් වැලියු ජංගම ගිණුම**

- සුපර් වැලියු ගිණුම ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘත කර පවත්වාගෙන යනු ඇත.
- **සුපර් වැලියු ජංගම ගිණුමක්** විවෘත කිරීම සඳහා ශ්‍රීලංරු.25,000ක මුදලක මූලික තැන්පතුවක් අවශ්‍ය වේ.
- සාමාන්‍ය මාසික ශේෂය **ශ්‍රීලංරු.25,000**ට වඩා පහත වැටුණහොත් ශ්‍රීලංරු.750ක ගාස්තුවක් අය කෙරෙන ඇති බවට ද මම/අපි එකඟ වෙමි/මු.

**මයි ඩ්‍රීම් ගිණුම**

- ගිණුම ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ විදේශ මුදල් වලින් (මා/අප විසින් දක්වා ඇති ලෙස) විවෘත කර පවත්වාගෙන යනු ඇත.
- මයි ඩ්‍රීම් ගිණුමක් විවෘත කිරීම සඳහා අවම අවශ්‍යතාවය **ශ්‍රීලංරු.5,000**ක් හෝ නම් කළ විදේශ මුදල් වර්ගයෙන් ඊට සමාන මුදලකි.
- මුදල් ආපසු ලබාගැනීමට බැංකුව විසින් අවසර දෙන්නේ පහත සඳහන් අවස්ථාවන්ගෙන් එකක් උදාවුවහොත් සහ ලේඛන ඉදිරිපත් කළහොත් පමණක් බවට මම/අප අවබෝධකරගෙන සිටිමි/මු.- **උසස් අධ්‍යාපනය, සංක්‍රමණය, හෝ හදිසි වෛද්‍ය වියදම් ආවරණය කිරීම සඳහා.**
- තත්කාලීන පොලී අනුපාත ගිණුමට අදාළ වන බවට මම/අප අවබෝධ කරගෙන සිටිමි/මු. **ඇමුණුම 1.1**

**සේවක බැංකුකරණ ගිණුම (සේ.බැ. ජංගම/ සේ.බැ. ඉතිරිකිරීම් )**

- ගිණුම ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘත කර පවත්වාගෙන යනු ඇත.
- පහත දක්වා ඇති ආකාරයට අවශ්‍ය මුදල් ප්‍රමාණය මාසිකව මුදල් බැරකිරීම මගින් මාගේ **සේවක බැංකුකරණ ගිණුම** ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට මම/අප එකඟ වෙමි/මු.
- පහත දැක්වෙන මුදල මාසිකව බැර නොකළහොත් මාසික මුදල් බැර නොකිරීමේ ගාස්තුවක් අයකරනු ලැබීමට මම/අප එකඟ වෙමි/මු.

| **අංශය** | **මාසිකව බැර කළ යුතුවන අවම මුදල** | **මාසික ගාස්තුව** |
|---|---|---|
| පෞද්ගලික බැංකුකරණය | 35,000/- | 650/- |
| ප්‍රමුඛතා බැංකුකරණය | 400,000/- | 2,500/- |

- ගිණුම විවෘත කිරීමේ ලේඛන ද සමඟ මාගේ/අපගේ වර්තමාන සේවායෝජක වෙතින් ලබාගත් වැටුප් පත්‍රිකාවක පිටපතක් ද මා/අප විසින් සපයා ඇත.
- සේවක බැංකුකරණය යටතේ සියලුම තනි පුද්ගල සැලසුම්වල විශේෂාංග හා එහි නීතිරීති හා කොන්දේසි පිළිබඳව මම/අප අවබෝධ කරගෙන සිටිමි/මු.

**ඉතුරුම් ගිණුම් සඳහා අදාළ වන පොලී අනුපාත - 1.1 වගුව**

| පොලී ශ්‍රේණි | ඉතුරුම් ගිණුම | මයි ඩ්‍රීම් ගිණුම | සේවක බැංකුකරණ ගිණුම |
|---|---|---|---|
| 3,000ට අඩු | - | - | - |
| 3,000-9,999 | 0.00% | 4.00% | 0.00% |
| 10,000-49,999 | 0.75% | 4.00% | 1.00% |
| 50,000-99,999 | 1.00% | 4.00% | 1.50% |
| 100,000-149,000 | 1.25% | 4.00% | 2.00% |
| 150,000-199,999 | 1.25% | 4.00% | 2.50% |
| 200,000-499,000 | 1.25% | 4.50% | 2.50% |
| 500,000- 999,000 | 1.50% | 5.00% | 2.75% |
| 1,000,000ට වැඩි | 2.00% | 5.00% | 3.00% |

**ගාස්තු සහ අයකිරීම් (1.2 වගුව)**

| ගාස්තු හා අයකිරීම් | අංශය | ඉතුරුම් ගිණුම | ජංගම ගිණුම් | මයි ඩ්‍රීම් ගිණුම | සේවක බැංකුකරණ | |
|---|---|---|---|---|---|---|
| | | | | | ඉතුරුම් | ජංගම |
| ගිණුම් ශේෂ අවශ්‍යතාවය | පෞද්ගලික බැංකුකරණය | 25,000 | 25,000 | 5,000 | අදාළ නැත | අදාළ නැත |
| | ප්‍රමුඛතා බැංකුකරණය | එක්රැස්වීමේ මට්ටම මත | | | | අදාළ නැත |
| ලෙජර් ගාස්තු | පෞද්ගලික බැංකුකරණය | 650 | 750 | අදාළ නැත | අදාළ නැත | අදාළ නැත |
| | ප්‍රමුඛතා බැංකුකරණය | අතහරින ලදී | අතහරින ලදී | අදාළ නැත | අදාළ නැත | අදාළ නැත |
| ඩෙබිට් කාඩ්- වාර්ෂික ගාස්තු | පෞද්ගලික බැංකුකරණය | 1250/- | 1250/- | අදාළ නැත | 1 වසර නොමිලේ | |
| ATM ගාස්තු- අප මත | සියලු | නොමිලේ | නොමිලේ | අදාළ නැත | නොමිලේ | නොමිලේ |

| | | | | | |
|---|---|---|---|---|---|
| ATM ගාස්තු- අපෙන් පිටත (දේශීය) | පෞද්ගලික බැංකුකරණය | ගනුදෙනුවකට 50/- | ගනුදෙනුවකට 50/- | අදාළ නැත | මාසයකට 15ක් දක්වා අතහැරේ |
| | ප්‍රමුඛතා බැංකුකරණය | නොමිලේ | නොමිලේ | අදාළ නැත | නොමිලේ |
| ATM ගාස්තු- අපෙන් පිටත (විදේශීය) SCB ATM | පෞද්ගලික බැංකුකරණය | ගනුදෙනුවකට 500/- | ගනුදෙනුවකට 500/- | අදාළ නැත | ගනුදෙනුවකට 500/- |
| | ප්‍රමුඛතා බැංකුකරණය | නොමිලේ | නොමිලේ | අදාළ නැත | නොමිලේ |

- ඉහත දක්වා ඇති ගාස්තු සහ පොලී අනුපාත මුදල් වෙළඳපොලෙහි හැසිරීම මත පදනම් වී කලින් කලට සිදුකෙරෙන වෙනස්වීම්වලට යටත් බව කරුණාවෙන් සලකන්න.
- අයකිරීම් මඟපෙන්වුමෙහි සඳහන් කර ඇති වෙනත් සියලු ගාස්තු/ අයකිරීම් බැංකුව කලින් කලට නිකුත් කරන සාමාන්‍ය ගිණුම්වලට අදළ වේ.
- අදාළ ගාස්තු හා අයකිරීම් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර සියලු ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකු ශාඛාවලින් ලබාගත හැකි වර්තමාන අයකිරීම් මඟපෙන්වුමෙහි පිටපතක් ලබාගන්න නැතිනම්, http://www.sc.com.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

---

**ප්‍රමුඛතා සේවා නියුක්තියන් නොවන බැංකු ගණුදෙනුකරුවන් සඳහා පමණි.**

- ඒකාබද්ධ නීතිරීති හා කොන්දේසිවල පිටපතක් මා/අප වෙත ලැබී ඇති අතර, එමඟින් සහ ඔබ විසින් කලින් කලට සිදුකරනු ඇති එහි සංශෝධන, වෙනස් කිරීම් හෝ වෙනස්වීම් මගින් බැඳී සිටීමට එකඟ වෙමි/මු.
- සේවා නීතිරීති හා යම් පහසුකමක් සඳහා (ප්‍රමුඛතා බැංකුකරණ සේවා ද ඇතුළුව) ඒවායෙහි අදාළතාව මම/අපි විසින් කියවා සම්පූර්ණයෙන් අවබෝධ කරගෙන ඇත.
- මම/අපි මෙමඟින් අයදුම්පතෙහි සවිස්තරව දක්වා ඇති ප්‍රමුඛතා බැංකුකරණ සේවාව සඳහා අයදුම් කරන අතර, අවම ශේෂය පවත්වාගැනීම සඳහා පවතින අවශ්‍යතා සම්බන්ධව සම්පූර්ණයෙන් අවබෝධ කරගෙන සිටින අතර, එසේ පවත්වා නොගතහොත් අදාළ පවත්වා නොගැනීමේ ගාස්තු ගෙවීමට එකඟ වෙමි/මු.

| අංශය | අවම ශේෂ මිණුම | මාසික ගාස්තුව |
|---|---|---|
| ප්‍රමුඛතා බැංකුකරණය | ශ්‍රී ලංකා රු. මිලියන 5 හෝ විදේශ ව්‍යවහාර මුදලින් ඊට සමාන මුදලක් | 2,500/- |

**ප්‍රමුඛතා ගනුදෙනුකරුවන් සඳහා පමණි** - මාගේ/අපගේ පවුලේ ළඟම ඥාතීන් වෙත ප්‍රමුඛතා බැංකුකරණ සේවාවන් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය නම්, මා/අප විසින් ඉහත දක්වා ඇති අවම ශේෂය පවත්වාගෙන යාමේ පදනම මත පමණක් එසේ ව්‍යාප්ත කරනු ඇති බවටද, මාගේ ගිණුම පහත හෙලනු ලැබුවහොත් පවුලේ අය සඳහා පහසුකම ඉවත්කරනු ඇති බවට ද මම/අපි සම්පූර්ණයෙන් දැනුවත් ව සිටිමි/සිටිමු.

---------------------------

ගනුදෙනුකරු/වන් වන මා/අප වෙත පිටපතක් සපයා දී ඇති ඉහත සඳහන් නීතිරීති හා කොන්දේසි මා/අප කියවා අවබෝධ කරගත් බව ද, එකී නීතිරීති හා කොන්දේසි සහ, බැංකුව විසින් සුදුසු යැයි සලකා කලින් කලට බැංකුව විසින් සිදුකරනු ඇති සංශෝධනවලින් බැඳී සිටීමට ද මම/අපි එකඟ වෙමි/මු.

**මම/අප (ගනුදෙනුකරු/ගනුදෙනුකරුවන්ගේ නම(නම්)** ________________________________________

<table>
<tr><td>---------------------- -------------------<br>මූලික ගනුදෙනුකරු 1 මූලික ගනුදෙනුකරු 2</td><td></td><td>දෙමාපිය/භාරකරුගේ අත්සන<br>මයි ඩ්‍රීම් ගිණුමට අදාළව පමණි</td></tr>
<tr><td colspan="3">කාර්යාලීය භාවිතය සඳහා පමණි<br>අත්සන තහවුරු කරගෙන පිළිගන්නා ලදී. -------------</td></tr>
</table>

**CB/CASA/MID-SIN/2017/02/01**